

ජගත් ජේ එදිරිසිංහ

# කටු 15

දැඩි සත්කාර ඒකකයට ඇතුල් වන කොරිඩෝවේ අසුනක වාඩි වී සිටි හසන්ත ඇලදෙණිය නිරාශා දැක නැගිට්ටේය. ඉදිරියට යන්නට ගිය ඇගේ ගමන වැළැක්වූයේ ඔහුය.

"කලබල වෙන්න එපා.." ඔහු පහත් හඬින් කීවේය. ඈ ඔහු පසු කර ඉදිරියට යන්නට උත්සාහ කළාය. ඔහු ඇගේ උරහිස මත අත තැබුවේය.

"දැන්ම යන්න එපා.." ඔහු කීවේය.

"ඇයි..? .. එයාට අමාරුද..?" ඇය එකවර ඇසූ ප්‍රශ්න දෙකටම ඔහු පිළිතුරු නොදුන්නේය. "..ටිකක් ඉඳල යන්න.. එකසැරේකට එක්කෙනෙකුට විතරයි යන්න දෙන්නෙ.." ඒ වෙනුවට ඔහු කීවේය. ඇය ඔහු දෙස බැලුවේ ප්‍රශ්නාර්ථයක් රැඳුණ ඇසිනි. ඔහු ඒ බැල්ම දරා ගත නොහැකිව මෙන් ඉවත බැලුවේය.

"කව්ද ඇතුළෙ ඉන්නෙ..?" ඈ ඇසුවාය. හසන්ත පිළිතුරක් නොදුන්නේය.

ඔහු දෙස මොහොතක් බලා සිටි නිරාශා විදුල සිටි කාමරයට ඇතුල් වන්නට හැරුණාය. කාමරයේ දොර අසළ දී ඇගේ ගමන නැවතුනි. විදුල ගේ ඇඳ අසළ වාඩි වී ඔහුගේ උරහිසට හිස තබාගෙන සිටි නාඳුනන තරුණිය දෙස නිරාශා බලා සිටියේ විමතියෙනි. ඈ ආපසු හැරී හසන්ත දෙස බැලුවාය. ඔහු අතින් සංඥා කළේ සන්සුන් වන ලෙස යයි ඈ සිතුවාය. දිග හුස්මක් ගත් නිරාශා දොර අසළ සිට බලා සිටියාය.

හසන්ත තමා පිටුපසින් සිටගෙන සිටිනු නිරාශාට දැනුණි.

"ඒ කව්ද..?" ඇය ඇසුවේ පහත් හඬිනි.

"මදාරා.. මදාරා වෛද්‍යසේකර.. විදුලගෙ ලෙක්චර් එක අහන්න ඇවිත් ඉන්නවා මං දැක්කා.. අපිත් එක්කම හොස්පිටල් එකට ආවා.. මං දන්නෙ එච්චරයි.." හසන්ත කීවේය.

මදාරා.. කොතැනකදී හෝ ඒ නම අසා ඇති බවක් නිරාශාට මතකය. එහෙත් ඒ කොතැනකදීදැයි පැහැදිළිව සිතන්නට මේ මොහොතේදී ඇයට නොහැකි විය. විදුලට මේ තරම් සමීප තරුණියක සිටි බවට ඉඟියක් හෝ තමා නොදැන සිටීම පිළිබඳ නිරාශා විමතියට පත්වූවාය. සියොළඟ පුරා සියුම් විදුලියක් දුව යන්නාක් මෙන් ඇයට දැනුණි.

"වාඩි වෙලා ඉන්න.." හසන්ත කීවේය. නිරාශා ඔහු අනුව ගොස් කොරිඩෝවේ වූ අසුනක වාඩි වූවාය. හසන්ත ෆිල්ටරයෙන් වතුර වීදුරුවක් පුරවා නිරාශා අතට දුන්නේය. ඇය ඉන් උගුරු කීපයක් බොන තෙක් ඔහු බලා සිටියේය. විදුලගේ තත්වය පිළිබඳ ඇයට කියන්නේ කෙසේදැයි සිතා ගන්නට ඔහු ඒ තත්පර කීපය යොදා ගත්තේය.

"විදුලට ටිකක් අමාරුයි.. ඔලුව ඇතුළට ලේ ගිහින් තියෙනවා... ඔපරේෂන් එකට පැය තුනකට වැඩිය ගියා.. බයවෙන්න එපා.. ඔපරේෂන් එක කළේ ඩොක්ටර් ගුණසේකර.. අතුල ගුණසේකර.. මේ සම්බන්ධව ලංකාවෙ ඉන්න හොඳම ස්පෙෂලිස්ට් සර්ජන්.." හසන්ත විස්තර කළේය. ".. මහ ඉස්පිරිතාලෙට ගෙනියන්නෙ නැතිව මේ හොස්පිට්ල් එකට මං විදුලව ගෙනාවෙත් ඒකයි."

පළමු වතාවට විදුල සිටින්නේ පුද්ගලික රෝහලක බවත් ඒ සඳහා මුදල් ගෙවිය යුතු බවත් නිරාශාට සිහිපත් විය.

"යන වියදම් ගැන වොරි වෙන්න අවශ්‍ය නැහැ.. ඒ ඔක්කොම මං බලා ගන්නම්.." හසන්ත කීවේ නිරාශාගේ සිත කියෙව්වාක් මෙනි. තමා මේ රෝහලේ කොටස්කරුවකු බවත් අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජිකයකු බවත් නිරාශාට නොකියා සිටීම මැනවැයි ඔහුට සිතුණි.

"මට ඇත්තම කියන්න.." නිරාශා කීවාය.

"දැනට අපි දන්නෙ එච්චරයි නිරාශා.. මෙතනින් එහාට යමක් කියන්න කාටවත් පුලුවන් කියල මං හිතන්නෙ නැහැ.. අපට තියෙන්නෙ දැන් බලා ඉන්න විතරයි.. කලබලවෙන්න අවශ්‍ය නැහැ.. හැමදේම හොඳින් වෙයි.."

හසන්ත කතා කරන අතරේදී නිරාශාගේ දෑස් රැඳවුණේ විදුල වෙතින් මෑත්ව ඔවුන් දෙසට පිය මනිමින් සිටි මදාරා දෙසය. හසන්ත සමගින් තමා දෙස බලා සිටිනා නිරාශා දුටු මොහොතේ මදාරාගේ සිත මදක් සැලුණි. ඇය මෙතැන මේ මොහොතේ දකින්නට මදාරා කිසි ලෙසකින්වත් බලාපොරොත්තු නොවූවාය. එසේ වුවද ඇය පැමිණ සිටීම යහපතැයි මදාරාට සිතුණි. මේ විදුලට ආදරය කරන්නවුන් ඔහු වටකොට ගත යුතු මොහොතයි.  ඔහු මේ අප්‍රසන්න රෝහල තුළ තනි කර තැබිය නොහැකිය.

නිරාශා ඉදිරියේ නැවතුණ මදාරා හිස ඔසවා ඇය දෙස බැලුවාය. ඇය දෙස එක එල්ලේ බලන්නට නොහැකි යම් කිසි අපහසු හැඟීමක් මදාරාගේ සිතේ ඇති වී නැති වී ගියේ ය. මදාරාගේ ඇස් පුරා පිරී තිබුණ කඳුලක් සීරුවෙන් පහළට ගලා යනු නිරාශා දුටුවාය.

"සර්ට අමාරුයි මිස්.." මදාරා අපහසුවෙන් කියා ගත්තාය. නිරාශා ඇගේ දකුණුත මදාරාගේ උරහිස මත තැබුවාය.

සිදුවෙමින් පවතින්නේ කිසිවිටෙක නොපැතූ දේ ය. විදුල මුණසිංහ නම් වන දරදඬු හිතුවක්කාර නිර්මාපකයා වෙතින් සීග්‍රයෙන් ඈත්ව යමින් තිබූ සිත මේ සා ඉක්මණින් ඔහු වෙත නැවත පැමිණියේ කෙසේද යන්න නිරාශාට තේරුම් ගත නොහැකි ය. ඔහු වෙනුවෙන් සිතේ ඉපිද තිබූ කෝපය කඳුළක් බවට හැරවෙනු ඇතැයි කිසි විටෙන කම් සිතුවෙම්ද?

සිදුවනු ඇත්තේ තමන්ට අවශ්‍ය දේ නොව සිදුවෙන්නට නියමිතව තිබූ සියල්ලයි. ඒ පිළිබඳ පාලනයක් කිසිවකුට තිබිය නොහැකිය. වැදගත් දෙය ධෛර්යවන්තව මුහුණ දීමයි. මදාරා හා කතා කරන්නට ඇගෙන් දැනගන්නට බොහෝ දේ ඇති නමුත් මේ එයට සුදුසු වේලාවක් නොවේ. අනෙක් අතින් එය මේ මොහොතේ වැදගත් කාරණයක්ද නොවේ. එකම වැදගත් කාරණය විදුල පමණකි. නිරාශා මදාරා වෙතින් මෑත්ව විදුල රඳවා සිටි කාමරයට ඇතුල් වූවා ය.